

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත

---

(1999 දෙසැම්බර් මස 31 වන දින දක්වා සංශෝධන ඇතුළත් කර ඇත)

---

පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය මගින් ප්‍රකාශිතයි

## පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත

පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද, පරිහාර සහ බලතල ප්‍රකාශ කිරීම හා නිශ්චය කොට දැක්වීම පිණිසත්, පාර්ලිමේන්තුවේ භාෂණයේ සහ විවාද කිරීමේ නැතහොත් කටයුතුවල නිරතවීමේ නිදහස ආරක්ෂා කිරීම පිණිසත්, පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීම් සම්බන්ධයෙන් දඬුවම් පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත්, පාර්ලිමේන්තු වාර්තා, ලියවිලි, කාර්ය සටහන්, සම්මත හෝ කටයුතු පළ කිරීමේ නියුක්ත ව සිටින තැනැත්තන් ආරක්ෂා කිරීම පිණිසත් වූ පනතකි.

1953 අංක 21 දරන පනත. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 5 දරන පනත 1980 අංක 17 දරන පනත 1984 අංක 25 දරන පනත 1987 අංක 37 දරන පනත 1997 අංක 27 දරන පනත

(ජාතික රාජ්‍ය සභාවේ 1978
අංක 5 දරන පනත - 1978 පෙබරවාරි 02)
(1980 අංක 17 දරන පනත - 1980 අප්‍රේල් 17)
(1984 අංක 25 දරන පනත - 1984 ජුනි 29)
(1987 අංක 37 දරන පනත - 1987 සැප්තැම්බර් 23)
(1997 අංක 27 දරන පනත - 1997 ඔක්තෝබර් 21)

(1953 අප්‍රේල් මස 7 වන දින.)

ලුහුඬු නාමය.

1. මේ පනත, පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අර්ථ නිරූපණය.

2. මේ පනතෙහි, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස—

"ලේකම්" යන්නෙන් පාර්ලිමේන්තුවේ මහ ලේකම් අදහස් වේ ;

"කාරක සභාව" යන්නෙන් පාර්ලිමේන්තුවේ යම් ස්ථාවර, විශේෂ හෝ වෙනත් කාරක සභාවක් අදහස් වේ ;

"පාර්ලිමේන්තුව" යන්නෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අදහස් කෙරෙන අතර ඊට කාරක සභාවක් ද ඇතුළත් වේ ;

"මන්ත්‍රීවරයා" යන්නෙන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු අදහස් කෙරෙන අතර ඊට සභාපතිවරයා, කථානායකවරයා සහ පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවක මූලාසන දරන යම් මන්ත්‍රීවරයකු, මන්ත්‍රීවරයා වශයෙන් ඇතුළත් වේ ;



PL 005250 -100 (2017/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

"පාර්ලිමේන්තුවේ නිලධරයා" යන්නෙන් පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලයට ස්ථිර ලෙස වුවත් තාවකාලික ලෙස වුවත් වරින්වර පත් කරනු ලැබිය හැකි යම් තැනැත්තකු අදහස් කෙරෙන අතර ඊට ලේකම් හා පාර්ලිමේන්තු භූමිය ඇතුළත කාර්යයෙහි යෙදී සිටින යම් පොලිස් නිලධරයකුද ඇතුළත් වේ ;

"සභාපතිවරයා" හෝ "කථානායකවරයා" යන්නට තත්කාලයෙහි පාර්ලිමේන්තුවේ මූලාසන දරන මන්ත්‍රීවරයා ඇතුළත් වේ ;

I වන කොටස

**සාමාන්‍ය වරප්‍රසාද, පරිහාර හා බලතල සාමාන්‍යයෙන් සහ පරිපූරක විධිවිධාන**

භාෂණයේ සහ විවාද කිරීමේ නිදහස.

3. පාර්ලිමේන්තුවේ දී භාෂණයේ, විවාද කිරීමේ හා කටයුතුවල නිරතවීමේ නිදහස තිබිය යුතු අතර ඒ භාෂණයේ, විවාද කිරීමේ හෝ කටයුතුවල නිරත වීමේ නිදහස පාර්ලිමේන්තුවෙන් පිටස්තර වූ යම් අධිකරණයක දී හෝ ස්ථානයක දී දෝෂාභියෝගයට හෝ ප්‍රශ්න කිරීමට භාජනය කළ නොහැකි වන්නේ ය.

ඇතැම් අවස්ථාවල දී මන්ත්‍රීවරුන්ට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව.

4. කිසිම මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ දී කියා තිබිය හැකි යම් දෙයක් හේතුකොටගෙන හෝ පෙත්සමක්, පනත් කෙටුම්පතක්, යෝජනා සම්මතයක්, මෝසමක් මගින් හෝ අන්‍යාකාරයෙන් පාර්ලිමේන්තුව වෙත ඔහු විසින් ඉදිරිපත් කර තිබිය හැකි යම් කරුණක් හෝ දෙයක් හේතුකොටගෙන හෝ ඔහු කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලට, සිරභාරයට ගැනීමකට, බන්ධනාගාරගත කිරීමකට හෝ අලාභවලට යටත් නොවන්නේ ය.

සිවිල් නඩු කටයුතුවල දී සිරභාරයට ගැනීමෙන් නිදහස් බව.

5. මේ පනත කඩ කිරීමක් සම්බන්ධයෙන් හැර, කිසිම මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ යම් රැස්වීමකට හෝ සභා වාරයකට ගමන් කරන අතරතුර දී හෝ පැමිණ සිටිය දී හෝ එහි සිට පෙරළා පැමිණෙන අතරතුර දී හෝ සිවිල් නඩු කටයුතුවලට විෂය විය හැකි යම් ණයක් හෝ කරුණක් සම්බන්ධයෙන් ඔහු සිරභාරයට ගැනීමට, රඳවා තැබීමට හෝ හිරිහැර කරනු ලැබීමට යටත් නොවන්නේ ය :

එසේ වුව ද මේ වගන්තිය යටතේ යම් පරිහාරයකට හෝ වරප්‍රසාදයකට අන්‍යාකාරයෙන් හිමිකම් ලද්දා වූ ද, යම් වස්තු භංගත්ව ක්‍රියාවක් සිදු කරනු ලැබ ඇතැයි පලකනු ලැබිය යුතු වූ ද, යම් තැනැත්තකුට ඒ පරිහාරය හෝ වරප්‍රසාද නොතිබූ විටක මෙන් වස්තු භංගත්ව ආඥාපනත යටතේ ඔහුට විරුද්ධව කටයුතු කරනු ලැබිය හැකි ය.

පාර්ලිමේන්තුවේ බලය යටතේ කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් තැනැත්තකු අලාභ ගෙවීමට බැඳී නොසිටින බව.

6. පාර්ලිමේන්තුවේ බලය යටතේ සහ එහි නෛතික බලතලවල සීමා ඇතුළත කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තෙක් අලාභවලට හෝ අන්‍යාකාරයෙන් හෝ බැඳීමකට යටත් නොවන්නේ ය.

පරිහාර එක්සත් රාජධානියේ මහජන මන්ත්‍රී මණ්ඩලය සතු පරිහාර විය යුතු බව.

7. මේ පනතින් පවරන ලද වරප්‍රසාද, පරිහාර හා බලතලවලට අතිරේකව, පාර්ලිමේන්තුව හා එහි මන්ත්‍රීවරයන් විසින්, එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලය හා එහි මන්ත්‍රීවරයන් විසින් තත්කාලයේ දරන, භුක්තිවිඳින හා ක්‍රියාත්මක කරන සහ ඒ හා සමාන පරිහාර දැරීම, භුක්තිවිඳීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

එක්සත් රාජධානියේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ ජර්නල, වරප්‍රසාද සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණවල දී මුල් බැල්මට සාක්ෂි විය යුතු බව.

8. මේ පනතේ විධිවිධානවලට යටත්ව, එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ නියමය පරිදි නැතහොත් එකී මන්ත්‍රී මණ්ඩලයෙහි මුද්‍රණකරු විසින් මුද්‍රණය කරනු ලැබ ඇති හෝ ඇතැයි හැඟෙන එකී මන්ත්‍රී මණ්ඩලයෙහි ජර්නල් වල හෝ කටයුතුවල පිටපතක් නැතහොත් එහි යම් කාරක සභා වාර්තාවක පිටපතක්, පාර්ලිමේන්තුවේ හෝ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර සහ බලතල විෂය කොට ගත් යම් පරීක්ෂණයක දී, එවැනි පිටපතක් බව ඔප්පු කිරීමක් නොමැතිව මුල් බැල්මට සාක්ෂියක් ලෙස ආවේශ්‍ය විය යුතු ය.

වරප්‍රසාද අධිකරණාත්මක ලෙස පිළිගත යුතු බව.

9. පාර්ලිමේන්තුවේ සියලුම වරප්‍රසාද, පරිහාර සහ බලතල ශ්‍රී ලංකාවේ සාමාන්‍ය හා පොදු නීතියේ කොටසක් විය යුතු අතර ඒවා ආයාචනා වශයෙන් ඉදිරිපත් කිරීම අනවශ්‍ය වන්නේ ය. එහෙත් ශ්‍රී ලංකාවේ සියලුම අධිකරණයන් හි දී ඒවා අධිකරණාත්මක ලෙස පිළිගත යුතු ය.

පැමිණෙන ලෙස සාක්ෂි කරුවන්ට නියම කිරීමේ බලය.

10. පාර්ලිමේන්තුව විසින් ද, තැනැත්තන්, ලියවිලි සහ වාර්තා ගෙන්වා ගැනීමට පාර්ලිමේන්තුවේ නියමයක් මගින් විධිමත් ලෙස බලය දෙනු ලැබූ යම් කාරක සභාවක් විසින් ද පාර්ලිමේන්තුව ඉදිරියට හෝ ඒ කාරක සභාව ඉදිරියට පැමිණෙන ලෙස සහ තම සන්තකයෙහි හෝ තමාගේ පාලනය යටතේ ඇති යම් ලියවිල්ලක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

පැමිණෙන ලෙස නිවේදනය කිරීම සිතාසි මගින් කළ යුතු බව.

11. පාර්ලිමේන්තුව ඉදිරියට හෝ යම් කාරක සභාවක් ඉදිරියට හෝ පැමිණෙන ලෙස හෝ පාර්ලිමේන්තුව ඉදිරියෙහි හෝ කාරක සභාවක් ඉදිරියෙහි හෝ ලේඛන ඉදිරිපත් කරන ලෙස හෝ කෙරෙන යම් නියමයක්, සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින් නැතහොත් කාරක සභාවේ සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන විධානයක් අනුව ලේකම්ගේ අත්සන යටතේ වූ සිතාසියක් මගින් පැමිණීමට හෝ ලේඛන ඉදිරිපත් කිරීමට හෝ නියමිත තැනැත්තා වෙත නිවේදනය කරනු ලැබිය යුතු ය. තව ද සිතාසිය භාරදෙනු ලබන තැනැත්තා පැමිණීමට නියමිත වේලාව සහ ස්ථානය ඔහු විසින් ඉදිරිපත් කරනු ලැබීමට නියමිත නිශ්චිත ලේඛනත්, ඒ සෑම සිතාසියක ම සඳහන් කරනු ලැබිය යුතු ය. තවද එහි නම් සඳහන් තැනැත්තා වෙත සිතාසිය භාරදීම එහි පිටපතක් ඔහු වෙත භාරදීමෙන් හෝ ශ්‍රී ලංකාව තුළ ඔහුගේ සාමාන්‍ය හෝ අන්තිමට දැන සිටි පදිංචි ස්ථානයෙහි සිටින යම් වැඩිහිටි තැනැත්තකු ළඟ එහි පිටපතක් තැබීමෙන් හෝ කරනු ලැබිය යුතු ය. ඒ සිතාසිය අනුව පැමිණෙන තැනැත්තා පාර්ලිමේන්තු සභා ගර්භයේ සිට හැතැක්ම පහක් ඇතුළත පදිංචිව නොසිටී නම්, සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින් හෝ නියම කරනු ලැබිය හැකි මුදලක් ඔහුගේ වියදම් වෙනුවෙන් ඔහුට ගෙවිය යුතු ය.

සාක්ෂිකරුවන් ගෙන් දිවුරුම් පිට ප්‍රශ්න ඇසිය හැකි බව.

12. පාර්ලිමේන්තුව හෝ එහි කාරක සභාවක් හෝ ඉදිරියෙහි ඇති පරීක්ෂණ විෂයයට සම්බන්ධ සිද්ධීන්, කරුණු හා දේවල් කිසිවක් සාක්ෂිකරුවන්ගෙන් වාචික ප්‍රශ්න ඇසීමෙන් සනාථ කළ යුතු යයි නැතහොත් අන්‍යාකාරයෙන් නිශ්චය කොට දැනගත යුතු යයි පාර්ලිමේන්තුව විසින් හෝ නියම කළ හැකි අතර සභාපතිවරයා හෝ කථානායකවරයා හෝ කාරක සභාවේ සභාපතිවරයා හෝ තත්කාර්ය සඳහා විශේෂයෙන් බලය දෙනු ලැබූ තැනැත්තා හෝ විසින් කරවනු ලැබිය හැකි දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් හෝ මත එවැනි යම් සාක්ෂි කරුවන්ගෙන් ප්‍රශ්න අසනු ලැබීමට සලස්වනු ලැබිය හැකි ය.

13. පාර්ලිමේන්තුව ඉදිරිපිට හෝ යම් කාරක සභාවක් ඉදිරියට හෝ පැමිණෙන ලෙස නැතහොත් පාර්ලිමේන්තුව ඉදිරියෙහි හෝ යම් කාරක සභාවක් ඉදිරියෙහි හෝ වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින් තමන් වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ එවැනි යම් ලියවිල්ලක්, පොතක්, වාර්තාවක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීම හෝ එය පෞද්ගලික ස්වභාවයේ වුවත් ය යන හා පරීක්ෂණ විෂයය කෙරෙහි බලපාන්නේ නැතැයි යන හේතුව පිට ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ඒ ප්‍රශ්නවලට පිළිතුරු දීමෙන් හෝ ඒ ලියවිල්ල, පොත, වාර්තාව හෝ ලේඛනය ඉදිරිපත් කිරීමෙන් හෝ ඔහු නිදහස් කිරීම නැතහොත් ඒවාට පිළිතුරු දෙන ලෙස හෝ ඒවා ඉදිරිපත් කරන ලෙස හෝ නියම කරනු ලැබීම හෝ අවස්ථාවෝචිත පරිදි සභාපතිවරයා හෝ කථානායකවරයා හෝ කාරක සභාවේ සභාපතිවරයා හෝ මූලාසන දරන මන්ත්‍රීවරයා හෝ විසින් කරනු ලැබිය හැකි ය.

ප්‍රශ්නයකට පිළිතුරු දීමට හෝ ලියවිලි ඉදිරිපත් කිරීමට දක්වන විරුද්ධත්වය, තීරණයන් ගැනීම සඳහා පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු බව.

14. යම් තැනැත්තකු–

(අ) පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් හෝ ඉදිරියෙහි දී ඒ තැනැත්තා දිවුරුවනු ලැබ හෝ ගම්භීරතා පූර්වකව ප්‍රතිඥාව හෝ ප්‍රකාශයක් කර සිටියත් නැතත් මේ වගන්තිය යටතේ දඬුවම් විඳීමකට බැඳීමකට ඔහු යටත් විය යුතු බවට විටිමත් ලෙස ඔහුට අවවාද කරනු ලැබීමෙන් පසු යම් පරීක්ෂණයක් පවත්වා ගෙන යන අතරතුර ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි පරීක්ෂණ විෂයයට වැදගත් වන යම් ප්‍රශ්නයකට ඕනෑකමින්ම අසත්‍ය පිළිතුරක් දෙන්නේ නම්, හෝ

(ආ) මේ පනතේ 26 වන වගන්තියේ කාර්ය සඳහා ඔහු විසින් කරනු ලබන යම් ප්‍රකාශයක දී ඕනෑකමින්ම බොරු සාක්ෂි දෙන්නේ නම්, හෝ

(ඔහු වරදකරු විය හැකි මේ පනතේ II වන කොටස යටතේ වූ යම් වරදකට අතිරේකව) දණ්ඩ නීති සංග්‍රහයේ 190 වන වගන්තිය යටතේ වරදකට ඔහු වරදකරු විය යුතු ය.

නීතිපතිවරයා විසින් හෝ ඔහුගේ අනුමතය ඇතිව හෝ හැර දණ්ඩ නීති සංග්‍රහයේ 190 වන වගන්තිය යටතේ වරදකට ඒ තැනැත්තාට විරුද්ධව අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

පාර්ලිමේන්තුව හෝ කාරක සභාව ඉදිරියේ බොරු සාක්ෂි දීමට දණ්ඩනය.

වරප්‍රසාදලත් සාක්ෂි සම්බන්ධයෙන් එක්සත් රාජධානියේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ පරිචය අදාළ කිරීම.

**15.** සාක්ෂි දීමට හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ කැඳවනු ලැබූ තැනැත්තකු ඒ සාක්ෂි දීම සම්බන්ධයෙන් හෝ ඒ ලේඛනය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් හෝ යම් අයිතිවාසිකමකට හෝ වරප්‍රසාදයකට හෝ හිමිකම් ලබද්දැයි හෝ නැද්දැයි යම් ප්‍රශ්නයක් පාර්ලිමේන්තුවේ දී හෝ යම් කාරක සභාවක දී හෝ උද්ගත වූ අවස්ථාවක, ඒ ප්‍රශ්නය නිශ්චය කරනු ලැබීම, ඒ හා සමාන කරුණුවල දී තත්කාලයෙහි එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුවේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ පවත්නා පරිචය අනුසාරයෙන් කළ යුතු ය.

සාක්ෂි සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් සතු පරිහාරය.

**16.** (1) මෙහි (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පාර්ලිමේන්තුව හෝ කාරක සභාවක් හෝ ඉදිරියේ සාක්ෂි දෙන තැනැත්තකු විසින් ඒ සාක්ෂි දීමෙහි දී කියා තිබිය හැකි යම් දෙයක් හේතු කොට ගෙන ඔහු යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලට බැඳීමකට යටත් නොවිය යුතු ය.

(2) පාර්ලිමේන්තුව හෝ කාරක සභාවක් හෝ ඉදිරියේ සාක්ෂි දීමේ දී යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් (3) වන උපවගන්තියේ සඳහන් නඩු කටයුතුවල දී හැර යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී ඒ තැනැත්තාට විරුද්ධව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය නොවිය යුතු ය.

(3) දණ්ඩ නීති සංග්‍රහයේ 190 වන වගන්තිය යටතේ වරදක් සඳහා හෝ පාර්ලිමේන්තුව හෝ කාරක සභාවක් හෝ ඉදිරියේ යම් තැනැත්තකු විසින් දෙන ලද යම් සාක්ෂියක් සම්බන්ධයෙන් මේ පනත යටතේ යම් වරදක් සඳහා හෝ ඔහුට විරුද්ධව යම් නඩු කටයුතු පැවරීම හෝ පවත්වාගෙන යාම හෝ මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කිසිවකින් නොවැළැක්විය යුතු ය. නැතහොත් වැළැක්වෙතැයි නොසැලකිය යුතු ය.

පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවේ කටයුතු පිළිබඳ සාක්ෂිදීම අනවසරයෙන් නොකළ යුතු බව.

**17.** පළමුව පාර්ලිමේන්තුවේ විශේෂ අවසරය නොලබා පාර්ලිමේන්තුවේ කිසිම මන්ත්‍රීවරයකු විසින් හෝ නිලධරයකු විසින් ද පාර්ලිමේන්තුව ඉදිරිපිට නැතහොත් යම් කාරක සභාවක් ඉදිරිපිට සාක්ෂි සටහන් කිරීම පිණිස සේවයෙහි නියුක්ත කරනු ලැබූ කිසිම ලඝු ලේඛකයකු විසින් ද ඒ සාක්ෂිවල අඩංගු කරුණු සම්බන්ධයෙන් නැතහොත් පාර්ලිමේන්තුව ඉදිරියෙහි හෝ යම් කාරක සභාවක් ඉදිරියෙහි හෝ තබන ලද යම් අත් පිටපතක හෝ ලේඛනයක අඩංගු කරුණු සම්බන්ධයෙන් නැතහොත් පාර්ලිමේන්තු සභා ගැබ සීමාව තුළ දී හෝ පාර්ලිමේන්තුවේ යම් කාරක සභාවක් ඉදිරිපිට දී හෝ පැවැත්වුණු යම් කටයුතු හෝ විභාගයක් සම්බන්ධයෙන් පිටස්තර ස්ථානයක දී සාක්ෂි නොදිය යුතු ය.

**18.** පාර්ලිමේන්තුවේ හෝ යම් මන්ත්‍රීවරයකුගේ හෝ වරප්‍රසාද, පරිහාර සහ බලතල සම්බන්ධයෙන් වූ යම් පරීක්ෂණයක දී රජයේ මුද්‍රණාලයාධිපති විසින් මුද්‍රණය කරන ලදැයි සලකනු ලබන පාර්ලිමේන්තු කාර්ය සටහන්වල හෝ පාර්ලිමේන්තුවේ කටයුතුවල හෝ යම් පිටපතක් ඒ පිටපත එසේ මුද්‍රණය කරනු ලැබූ බව තිසි ලෙසකින් ඔප්පු කිරීමක් නොමැතිව සියලු අධිකරණවල දී හා ස්ථානවල දී හා ඒ කාර්ය සටහන් හෝ කටයුතු පිළිබඳ සාක්ෂි වශයෙන් ආවේශ්‍යා විය යුතු ය.

පාර්ලිමේන්තුවේ නියමය පරිදි මුද්‍රිත කරුණු සාක්ෂි වශයෙන් ආවේශ්‍යා බව.

**19.** (1) යම් තැනැත්තකු විසින් හෝ ඔහුගේ සේවකයා විසින් හෝ–

පාර්ලිමේන්තුවේ අධිකාරය යටතේ පළකරන ලද වාර්තා ආදිය පළ කිරීම සඳහා සහ ඒවායේ පිටපත් හෝ එයින් ගත් උධෘත පළ කිරීම සඳහා ආරක්ෂාව (1984 අංක 25 § 2)

(අ) පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක නියමය පරිදි හෝ එහි අධිකාරය යටතේ පළ කරන ලද වාර්තාවක්, පත්‍රිකාවක්, කාර්ය සටහනක්, සම්මත හෝ කටයුතු වන වාර්තාවක්, පත්‍රිකාවක්, කාර්ය සටහනක්, සම්මත හෝ කටයුතු ; හෝ

(ආ) එවැනි යම් වාර්තාවක, පත්‍රිකාවක, කාර්ය සටහනක, සම්මතවල හෝ කටයුතුවල පිටපතක්

පළකිරීම සඳහා හෝ පළ කිරීම වෙනුවෙන් හෝ පළ කිරීම සම්බන්ධයෙන් පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල විත්තිකරුවකු වන ඒ තැනැත්තා විසින් පැමිණිලිකරුට හෝ චෝදකට තම අදහස පිළිබඳ පැය විසිහතරක දැනුම් දීමකින් පසු,

(i) (අ) ඡේදයෙහි සඳහන් පළකිරීමක් සම්බන්ධයෙන් පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන් වන විට, ඒ නඩු කටයුතු පවත්වනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය වෙත, ඒ නඩු කටයුතු පැවරීමට සම්බන්ධ වාර්තාව, පත්‍රිකාව, කාර්ය සටහන, සම්මත හෝ කටයුතු ඒ තැනැත්තා හෝ ඔහුගේ සේවකයා විසින්, පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක නියමය හෝ අධිකාරය යටතේ පළ කරන ලද බව ප්‍රකාශ කෙරෙන කථානායකවරයාගේ හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ හෝ අත්සන යටතේ වූ සහතිකයක්; හෝ

(ii) (ආ) ඡේදයෙහි සඳහන් පළ කිරීමක් සම්බන්ධයෙන් පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතු සම්බන්ධයෙන් වන විට, ඒ නඩු කටයුතු පවත්වනු ලබන්නේ යම් අධිකරණයක් ඉදිරියේ ද ඒ අධිකරණය වෙත, ඒ නඩු කටයුතු පවරන ලද්දේ යම් පිටපතක් සම්බන්ධයෙන් ද ඒ පිටපත සහ ඒ පිටපත යයි කියනු ලබන වාර්තාව, පත්‍රිකාව, කාර්ය සටහන, සම්මත හෝ කටයුතු සහ ඒ වාර්තාව, පත්‍රිකාව, කාර්ය සටහන, සම්මත හෝ කටයුතු සහ ඒ පිටපතේ නිවැරදි බව සත්‍යයනය කෙරෙන දිවුරුම් පත්‍රයක් ද සමග

ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, එවිට, ඒ අධිකරණය විසින්, ඒ සිවිල් හෝ අපරාධ නඩු කටයුතු වහාම නතර කරනු ලැබිය යුතු අතර, ඒ නඩු කටයුතු සහ එහි ලා නිකුත් කරන ලද සෑම අධිකරණ නියෝගයක්ම අවසානාත්මකව තීරණය කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් හෝ ඔහුගේ සේවකයා විසින් –

(අ) පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක නියමය පරිදි හෝ අධිකාරය යටතේ පළ කරන ලද යම් වාර්තාවකින්, පත්‍රිකාවකින්, කාර්ය සටහනකින්, සම්මත වලින් හෝ කටයුතු වලින් ලබාගත් යම් උධෘතයක් හෝ එහි උපුටනයක්:

(ආ) පාර්ලිමේන්තුව විසින් පළ කිරීම සඳහා බලය දෙන ලද කටයුත්තක් වන පාර්ලිමේන්තුවේ යම් කටයුතු පිළිබඳ සාධාරණ හා නිවැරදි වාර්තාවක්

සද්භාවයෙන් සහ ද්වේශයෙන් තොරව පළ කිරීම සඳහා හෝ පළ කිරීම වෙනුවෙන් හෝ පළ කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලට ඒ තැනැත්තා යටත් නොවිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "සිවිල් හෝ අපරාධ නඩු කටයුතු" යන යෙදුමට, ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ අභියාචනාධිකරණයට හෝ මහාධිකරණයට හෝ වෙනත් යම් අධිකරණයකට, විනිශ්චයාධිකාරයකට හෝ ආයතනයකට හෝ අපහාස කිරීමේ දඬුවම සඳහා වූ යම් නඩු කටයුතු ඇතුළත් වන්නේ ය.

ආගන්තුකයන් ඇතුළ් කරවීම විධිමත් කිරීම.

20. (1) පාර්ලිමේන්තුවට හෝ එහි භූමියට පිවිසීමට හෝ ඒ ඇතුළත රැඳී සිටීමට කිසිම ආගන්තුකයෙක් අයිතිවාසිකමක් වශයෙන් හිමිකම් නොලැබිය යුතු ය.

(2) පාර්ලිමේන්තුවට හෝ එහි භූමියට ආගන්තුකයන් ඇතුල් කරවීම විධිමත් කිරීම සඳහාත් පාර්ලිමේන්තුවේ හා එහි භූමියෙහි විනය හා හික්මීම පවත්වා ගැනීම සඳහාත් සභාපතිවරයාගේ හෝ කථානායකවරයාගේ හෝ අභිමතය පරිදි අවශ්‍ය වේතැයි සැලකිය හැකි නියම නිකුත් කිරීමට මෙයින් ඔහුට බලය දෙනු ලැබේ.

(3) මේ වගන්තිය යටතේ සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින් හෝ කරනු ලබන නියමවල පිටපත්, ලේකම් විසින් නිවැරදි බව විධිමත් ලෙස සහතික කොට ඒවා පාර්ලිමේන්තුවේ භූමිය ඇතුළත ප්‍රකටව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතු ය. එලෙස නිවැරදි බව සහතික කොට ප්‍රදර්ශනය කරනු ලැබූ කල්හි ඒ පිටපත් ඒවා බලපාන්නේ යම් තැනැත්තන් කෙරෙහි ද ඒ සියලුම තැනැත්තන් වෙත ඉදිරිපත් කරන ලද ප්‍රමාණවත් දැන්වීමක් සේ සලකනු ලැබිය යුතු ය.

(4) පාර්ලිමේන්තුවෙන් හෝ එහි භූමියෙන් ඉවත්වන ලෙස යම් ආගන්තුකයකුට සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින් හෝ යම් වේලාවක නියම කරනු ලැබිය හැකි ය.

පාර්ලිමේන්තුවේ වැඩ කටයුතුවලට බාධා පමුණුවන තැනැත්තකු වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගතහැකි බව.

21. (1) පාර්ලිමේන්තුව තථ්‍ය ලෙස රැස්ව සිටිය දී පාර්ලිමේන්තුව තුළ හෝ එහි භූමියෙහි යම් බාධාවක් ඇති කරන හෝ එහිලා හවුල් වන යම් තැනැත්තකු සභාපතිවරයාගේ හෝ කථානායකවරයාගේ හෝ වාචික හෝ ලිඛිත නියමයක් අනුව, වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබිය හැකි අතර II වන කොටස යටතේ වරදක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට දඬුවම් කළ යුතු ද නැද්ද යන වග පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන තෙක් ඔහු පාර්ලිමේන්තුවේ නිලධරයකුගේ රැකවරණයෙහි තැබිය හැකි ය : එහෙත් රැස්වීම අවසන්වීමෙන් පසු ඒ කිසිම තැනැත්තකු රැකවරණයෙහි තබාගනු නොලැබිය යුතු ය.

(2) ඉහත කී පරිදි යම් නියමයක් ප්‍රකාර යම් තැනැත්තකු අල්ලා ගැනීමෙහිලා හා රඳවා තැබීමෙහිලා සහාය වෙන ලෙස සියලු පොලිස් නිලධරයන්ට, කොස්තාපල්වරුන්ට හා වෙනත් තැනැත්තන්ට මෙයින් නියම කරනු ලැබේ.

II වන කොටස

**පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම හා ඒවාට දඬුවම් පැමිණවීම**

වරප්‍රසාද කඩකිරීම.

**22.** (1) මේ පනතේ උපලේඛනයෙහි දැක්වෙන ක්‍රියා හා නොකර හැරීම් අතුරින් එක් එක් ක්‍රියාව හා නොකර හැරීම පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීමක් ලෙස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(1978 අංක 5 § 2)
(1997 අංක 27 § 2)

(2) මේ පනතේ උපලේඛනයෙහි ('අ' කොටසේ හෝ 'ආ' කොටසේ හෝ වුවද), දැක්වෙන පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ සෑම කඩකිරීමක් ම, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තත් කාර්යය සඳහා මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධාන යටතේ දඬුවම් කරනු ලැබිය හැකි, මේ කොටස යටතේ වූ වරදක් විය යුතු ය.

(1978 අංක 5 § 2)
(1997 අංක 27 § 2)

(3) මේ පනතේ උපලේඛනයේ 'ආ' කොටසේ සඳහන් වන්නා වූ ද පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් හෝ අදාළව සිදුකරන්නා වූ ද පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ සෑම කඩකිරීමක් ම, තත් කාර්ය සඳහා මෙහි සලස්වනු ලබන විධිවිධාන යටතේ පාර්ලිමේන්තුව විසින් දඬුවම් කරනු ලැබිය හැකි මේ කොටස යටතේ වූ වරදක් විය යුතු ය.

වරප්‍රසාද කඩකිරීම්වල දී ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලය.

**23.** (1) නීතිපතිවරයා විසින් තත්කාර්ය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරමින් දිවුරුම් පත්‍රයක් මත වූ සාක්ෂි මගින් එය සනාථ කරනු ලබන කල්හි, අධිකරණය විසින්–

(අ) ඉල්ලීම හා ඒ සාක්ෂි කියවා බැලීමෙන් පසු යම් මන්ත්‍රීවරයකු හෝ වෙනත් තැනැත්තකු හෝ මේ කොටස යටතේ යම් වරදක් සිදුකරනු ලැබ ඇතැයි සෑහීමකට පත්වුවහොත් ඒ මන්ත්‍රීවරයාට හෝ ඒ තැනැත්තාට හෝ එම වරද සම්බන්ධයෙන් දඬුවම් කළ යුතු නොවන්නේ මන්දැයි හේතු දක්වන ලෙස නියම කෙරෙන දැන්වීමක් ඔහුට භාර දීමට සැලැස්වනු ලැබිය හැකි ය . තව ද ;

(ආ) ඉහත කී පරිදි අධිකරණය සෑහීමකට පත්වන කිසිම හේතුවක් හෝ අධිකරණය සෑහීමට පත්වන පරිදි කිසිම ප්‍රමාණවත් හේතුවක් හෝ නොදක්වනු ලැබුවහොත්, අධිකරණය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි පරීක්ෂණයකින් පසුව, ඔහු වරදට වරදකරු කොට ඔහුට අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන්

එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමේ හෝ දඩයකට නියම කිරීමේ හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකම නියම කිරීමේ දණ්ඩන නියමයක් කළ හැකි ය. (1997 අංක 27 § 2)

* (2) ඉවත් කරන ලදී. (1997 අංක 27 § 3)

ශ්‍රේෂ්ඨාධිකරණයේ කාර්ය පටිපාටිය.

**24.** 23 වන වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබූ කල්හි, අනුගමනය කළ යුතු නඩු කටයුතු හා කාර්ය පරිපාටිය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ තත් කාර්යය සඳහා පනවනු ලැබීමට මෙයින් බලය දෙනු ලබන යම් රීතිවලට යටත්ව, අග්‍රවිනිශ්චයකාරවරයා විසින් හෝ ඉල්ලීම විභාග කරන ශ්‍රේෂ්ඨාධිකරණයේ කණිෂ්ඨ විනිශ්චයකාරවරයා විසින් හෝ නිශ්චය කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය: තව ද ඒ නඩු කටයුතු සම්බන්ධයෙන් හා ඒ නඩු කටයුතුවල කාර්යය සඳහා තැනැත්තන්ගේ පැමිණීමට හා ලේඛන ඉදිරිපත් කිරීම බල කිරීමේ හෝ අන්‍යාකාරයෙන් වූ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තම සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී තමා සතු බලතල ම ශ්‍රේෂ්ඨාධිකරණය සතු වන්නේ ය.

ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට පූර්වගාමී කොන්දේසි.

**25.** (1) පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් හෝ ඒ විෂයෙහි ලා මේ කොටස යටතේ කරන ලදැයි කියන යම් වරදක දී පහත සඳහන් කරුණු සපුරාලියහොත් පමණක්, නීතිපතිවරයා විසින් 23 වන වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය :-

(අ) තම මතය අනුව එම කාරණය සම්බන්ධයෙන් මේ පනත යටතේ තවදුරටත් පියවර ගැනීම සාධාරණ බවට පත් කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඇති බව සඳහන් කෙරෙන වාර්තාවක් නීතිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ සභාපතිවරයා වෙත හෝ කථානායකවරයා වෙත යවා තිබීම ; හා

(ආ) එම පාර්ලිමේන්තුව විසින් ඒ වාර්තාව ගැන සලකා බැලීමෙන් පසු ඉල්ලීම කරන ලෙස යෝජනා සම්මතයක් මගින් නීතිපතිවරයාට නියම කර තිබීම.

*1997 අංක 27 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) (සංශෝධන) පනතේ 3 වන වගන්තිය බලන්න.

(2) යම් කාරණයක දී නීතිපතිවරයා විසින් 23 වන වගන්තිය යටතේ ඉල්ලීමක් කිරීම, මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන වලට අනුකූලව විධිමත් ලෙස ඉල්ලීම කරනු ලැබ ඇති බවට තීරණාත්මක සාක්ෂියක් වන්නේ ය.

කාරණා ප්‍රකාශ සහිතව, නීතිපතිවරයා වෙත යොමු කිරීම.

26. (1) මේ කොටස යටතේ කරන ලදැයි කියන වරදක් වූ යම් කාරණයක් සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් වාර්තාවක් සැපයිය හැකිවීමේ කාර්යය සඳහා, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින්-

(අ) කරන ලදැයි කියන වරදක් පිළිබඳව, යම් මන්ත්‍රීවරයකු තමන් වෙත සභා ගර්භය තුළ දී පැමිණිලි කළ කල් හි, හෝ

(ආ) පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් එසේ කිරීමට නියම කරනු ලැබුවහොත්,

වාර්තා කිරීම සඳහා ඒ කාරණය නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(2) මෙහි (1) වන උපවගන්තිය යටතේ කාරණයක් නීතිපතිවරයා වෙත යොමු කළ යුතු අවස්ථාවක් වූ විට සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින් නැතහොත් එසේ කරන ලෙස සභාපතිවරයා හෝ කථානායකවරයා හෝ විසින් ලියවිල්ලකින් වෙනත් යම් මන්ත්‍රීවරයකුට බලය දෙනු ලැබුවේ නම් ඒ මන්ත්‍රීවරයා විසින් නැතහොත් එසේ බලය දෙනු ලැබුවහොත් පාර්ලිමේන්තුවේ ලේකම් විසින්-

(අ) කරන ලදැයි කියන වරද පිළිබඳ පැමිණිල්ල කරන මන්ත්‍රීවරයාගේ ප්‍රකාශය දිවුරුම් පිට හෝ ප්‍රතිඥාවක් පිට සටහන් කරගත යුතු ය ; තව ද

(ආ) සභාපතිවරයාගේ හෝ කථානායකවරයාගේ හෝ මතය අනුව සාක්ෂි අදාළ වන හෝ අදාළ විය හැකි වෙනත් යම් තැනැත්තකුගේ ප්‍රකාශයක් දිවුරුම් පිට හෝ ප්‍රතිඥාවක් පිට සටහන් කරගත හැකි ය.

සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින් හෝ සිය කැමැත්තෙන්ම හෝ නීතිපතිවරයාගේ ඉල්ලීම අනුව හෝ අවශ්‍ය යැයි සලකනු ලැබුවහොත්, කාරණය නීතිපතිවරයා වෙත යොමු

කරනු ලැබීමෙන් පසු ඕනෑම අවස්ථාවක දී මේ වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ යම් තැනැත්තකුගේ ප්‍රකාශය සටහන් කරගත හැකි ය.

(3) 10 සිට 13 දක්වා වූ වගන්තිවල විධිවිධාන, කාරක සභාවක් විසින් සාක්ෂි සටහන් කර ගැනීම හැකිවීමේ කාර්යය සඳහා අදාළ වන ආකාරයෙන් ම මේ වගන්තියේ (2) උප වගන්තිය යටතේ ප්‍රකාශ සටහන් කරගත හැකිවීමේ කාර්යය සඳහා ද සර්වප්‍රකාරයෙන් අදාළ විය යුතු අතර, ඉහත කී කාර්යය සඳහා ඒ ප්‍රකාශය ගැනීමට මේ වගන්තියේ (2) වන උපවගන්තියෙන් හෝ ඒ යටතේ බලයලත් තැනැත්තා සතු බලතල, ඒ වගන්තිවලින් කාරක සභාවකට හෝ එහි සභාපතිවරයාට හෝ පැවරෙන බලතල වලට සමවිය යුතු ය.

(4) 15 සිට 17 දක්වා වූ වගන්තිවල විධිවිධාන, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ කාර්ය සඳහා දෙනු ලබන යම් සාක්ෂියකට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද මේ කොටස යටතේ වරදක් කරන ලදැයි කියනු ලබන තැනැත්තකුගේ එම වරද සම්බන්ධයෙන් (2) වන උපවගන්තිය යටතේ යම් ප්‍රකාශයක් කිරීමට ඔහුගේ කැමැත්ත නොමැතිව බැඳීමකට යටත් කිරීම හෝ බලකිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(6) වාර්තා කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ නීතිපතිවරයා වෙත කාරණයක් යොමු කරනු ලබන අවස්ථාවක, (2) වන උපවගන්තිය යටතේ ලබාගත් සියලු ප්‍රකාශවල වාර්තාව නීතිපතිවරයා වෙත යැවිය යුතු අතර නීතිපතිවරයා විසින් ඒ ප්‍රකාශ ගැන සලකා බැලීමෙන් පසු මේ කොටස යටතේ කරන ලදැයි කියන වරදක් සම්බන්ධයෙන් මේ පනත යටතේ තවදුරටත් පියවර ගැනීම සාධාරණ බවට පත් කිරීමට ප්‍රමාණවත් සාක්ෂි නීතිපතිවරයාගේ මතය අනුව ඇත්දැයි සඳහන් කරමින් සභාපතිවරයා වෙත හෝ කථානායකවරයා වෙත වාර්තා කළ යුතු ය. තවද ඒ වාර්තාවෙහි නීතිපතිවරයාගේ මතය අනුව ප්‍රකාශවල ඇතුළත් සාක්ෂි මගින් ඔප්පු කළ හැකි සිද්ධි පිළිබඳ සාරාංශයක්, පාර්ලිමේන්තුවේ දැන ගැනීම සඳහා ද අඩංගු විය යුතු ය.

උපලේඛනයෙහි 'ආ' කොටසේ දැක්වෙන වැරදි පිළිබද පාර්ලිමේන්තුවේ අධිකරණ බලය.

(1978 අංක 5 § 3)

**27.** (1), (2) වන සහ (3) වන උප වගන්තිවල විධිවිධාන වලට යටත්ව, මේ පනතේ උප ලේඛනයෙහි 'ආ' කොටසේ සඳහන් වන්නා වූ ද පාර්ලිමේන්තුව සම්බන්ධයෙන් හෝ ඊට අදාළව මන්ත්‍රීවරයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් සිදු කරන්නා වූ ද පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබද යම් කඩකිරීමක් සම්බන්ධයෙන් ලඝු ආකාරයෙන් දඬුවම් කිරීමට පාර්ලිමේන්තුවට බලය සහ අධිකරණ බලය තිබිය යුතු ය.

(1997 අංක 27 § 4)

*(1අ) ඉවත් කරන ලදී.

(2) මෙහි මින් පෙර විධිවිධාන සලස්වනු ලැබූ පරිදි නීතිපතිවරයා වෙත යොමු කරනු ලැබ ඇති යම් කාරණයක දී මේ පනත යටතේ යම් වරදකට දඬුවම් කිරීමේ බලය, කරන ලදැයි කියන වරද සම්බන්ධයෙන් මේ පනත යටතේ තවදුරටත් පියවර ගැනීම, නීතිපතිවරයාගේ මතය අනුව සාධාරණ බවට පත්කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඇති බවට 26 වන වගන්තිය යටතේ වාර්තාවක් නීතිපතිවරයා විසින් සපයනු ලැබ ඇත්නම් මිස, පාර්ලිමේන්තුව සතු නොවිය යුතු ය.

(3) 23 වන වගන්තිය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබ ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් මේ කොටස යටතේ යම් වරදක් සංජානනය කිරීමේ හෝ යම් වරදකට දඬුවම් කිරීමේ බලය පාර්ලිමේන්තුව සතු නොවිය යුතු ය.

(1997 අංක 27 § 5)

† 27අ. ඉවත් කරන ලදී.

පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි දඬුවම.

**28.** මේ කොටස යටතේ යම් වරදක් සඳහා පාර්ලිමේන්තුව විසින් නියම කරනු ලැබිය හැකි දඬුවම, පාර්ලිමේන්තුවේ සභා ගැබ සීමාවට කැඳවා අවවාද කිරීම හෝ සභා භූමියෙන් ඉවත් කිරීම හෝ විය යුතු ය :

---

*1997 අංක 27 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) (සංශෝධන) පනතේ 4 වන වගන්තිය බලන්න.

†1997 අංක 27 දරන පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) (සංශෝධන) පනතේ 5 වන වගන්තිය බලන්න.

එසේ වුව ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට මෙහි මීන් පෙර සඳහන් යම් දඬුවමකට අමතරව හෝ යම් දඬුවමක් වෙනුවට, එක් මාසයක් නොඉක්මවන යම් කාලයක් තුළ පාර්ලිමේන්තුවේ සේවය කිරීමෙන් ඔහු අත්හිටුවීමේ නියමයක් පාර්ලිමේන්තුව විසින් කරනු ලැබිය හැකි ය : (1978 අංක 5 § 5) (1987 අංක 37 § 3) (1997 අංක 27 § 6)

එසේ ම තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවන තැනැත්තකු විසින් සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් වන විට, හය මාසයක් නොඉක්මවන කාලයක් තුළ පාර්ලිමේන්තුවට හෝ එහි භූමියට හෝ ඇතුළුවීම ඒ තැනැත්තාට තහනම් කළ යුතු යයි නියම කිරීම ද පාර්ලිමේන්තුව විසින් කරනු ලැබිය හැකි ය.

දඬුවම ක්‍රියාවේ යෙදවීම සඳහා පිරහාරයට ගැනීමේ බලය.

**29.** 28 වන වගන්තිය යටතේ අවවාද කිරීම සඳහා යම් තැනැත්තකු පාර්ලිමේන්තුවේ සභා ගැබ සීමාවට, පැමිණෙන බවට වග බලාගැනීමේ කාර්යය සඳහා නැතහොත් ඒ වගන්තිය යටතේ පාර්ලිමේන්තු භූමියෙන් ඉවත් කරන ලෙස නියම කරනු ලැබ ඇති යම් තැනැත්තකු නැතහොත් එම වගන්තිය යටතේ පාර්ලිමේන්තු භූමියට ඇතුළුවීම තහනම් කරනු ලැබ ඇති යම් තැනැත්තකු පාර්ලිමේන්තු භූමියෙන් ඉවත් කිරීමේ කාර්යය සඳහා සභාපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි ප්‍රවේශක නිලධරයා විසින් හෝ පාර්ලිමේන්තුවේ වෙනත් යම් නිලධරයකු විසින් හෝ පොලිස් නිලධරයකු විසින් හෝ ප්‍රවේශක නිලධරයාට හෝ වේත්‍රධාරියාට හෝ පාර්ලිමේන්තුවේ වෙනත් යම් නිලධරයකුට හෝ පොලිස් නිලධරයකුට හෝ එසේ කරන ලෙස නියම කරනු ලැබුවහොත්, පාර්ලිමේන්තු භූමිය ඇතුළත යම් ස්ථානයක දී වරෙන්තුවක් නොමැතිව ඒ තැනැත්තා පිර හාරයට ගැනීම හා ඉහත කී කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සාධාරණ බලය යෙදීම නීත්‍යානුකූල වන්නේ ය.

වරප්‍රසාද කඩකිරීම් වල දී කාර්ය පටිපාටිය සඳහා ස්ථාවර නියෝග.

**30.** මේ කොටස යටතේ කරන ලදැයි කියන වැරදි පිළිබඳ කාරණාවල දී පාර්ලිමේන්තුවේ දී හෝ සභාපතිවරයා විසින් නැතහොත් කථානායකවරයා විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ආනුෂංගික හෝ පරිපූරක විධිවිධාන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අඩංගු විය හැකි අතර

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග වලින් විශේෂයෙන්ම වරප්‍රසාද පිළිබඳ කාරක සභා පත්කිරීම සඳහාත් ඒවායේ බලතල කර්තව්‍ය හා කාර්ය පරිපාටිය සඳහාත් විධිවිධාන සැලැස්විය හැකි ය.

අපරාධ හා සිවිල් නඩුවලට ඉඩ හැරීම.

**31.** (1) මේ කොටස යටතේ වරදක් වෙතැයි මේ පනතින් ප්‍රකාශිත යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ද වරදක් බවට පත්වන අවස්ථාවක, වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද ඒ ක්‍රියාවට හෝ නොකර හැරීමට වරදකරු වන තැනැත්තෙක් වැරදි දෙකම සම්බන්ධයෙන් නඩු විභාග කරනු ලැබීමට හා දඬුවම් කරනු ලැබීමට යටත් විය යුතු ය.

(2) යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් මේ කොටස යටතේ වරදක් වුව ද ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් හෝ එය හේතුකොටගෙන ලබා ගත හැකි අලාභ හෝ වෙනත් යම් ප්‍රතිකර්මයක් සඳහා යම් තැනැත්තකුට විරුද්ධව යම් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම හෝ මේ පනතේ කිසිවකින් වැළක්වෙතැයි හෝ සීමා කෙරෙතැයි තේරුම් නොගත යුතු ය.

පාර්ලිමේන්තුව විසින් දඬුවම් කිරීමේ බලය සීමා කිරීම

(1978 අංක 5 § 6)

(1997 අංක 27 § 7)

**32.** මේ පනතේ ඇතුළත් කිසිවකින් උපලේඛනයේ 'ආ' කොටසේ සඳහන් යම් වරදක් සඳහා මේ පනතේ 28 වන වගන්තියෙන් බලය දී ඇති යම් දඬුවමක් නියම කිරීම පිණිස වූ බලය හැරෙන්නට, යම් තැනැත්තකු කෙරෙහි යම් දඬුවමක් නියම කිරීමට යම් බලයක් පාර්ලිමේන්තුව වෙත නොපැවරෙන අතර එසේ පැවරෙන්නේ යයි තේරුම් ගනු නොලැබිය යුතු ය.

## උපලේඛනය

### අ කොටස

(1978 අංක 5 § 7)
(1997 අංක 27 § 8)

**ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පමණක් ම දඬුවම් කළ හැකි වැරදි.**

1. පාර්ලිමේන්තුවට පැමිණෙන හෝ පාර්ලිමේන්තුවෙන් පිට වී යන හෝ යම් මන්ත්‍රීවරයකුට හෝ පාර්ලිමේන්තුව තුළ දී හෝ යම් කාරක සභාවක මන්ත්‍රීවරයකුගේ ක්‍රියා කලාපය හේතුකොටගෙන ඒ මන්ත්‍රීවරයාට පහරදීම, නින්දා කිරීම හෝ හිතා මතා බාධා පැමිණවීම නැතහොත් පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් ඉදිරියෙහි පවත්නා හෝ ගෙන එනු ලබතැයි අපේක්ෂිත යම් යෝජනාවකට හෝ කරුණකට තමා පක්ෂ බවට හෝ විපක්ෂ බවට ප්‍රකාශ කරවා ගැනීමට යම් මන්ත්‍රීවරයකුට බලාත්කාරය, නින්දාව හෝ තර්ජනය මගින් බලකර සිටීමට වෑයම් කිරීම.

2. පාර්ලිමේන්තුව තුළ දී හෝ කාරක සභාවේ දී මන්ත්‍රීවරයකුගේ ක්‍රියා කලාපය හේතු කොටගෙන මහු වෙත යම් තර්ජනාත්මක ලිපියක් යැවීම හෝ සටනට එන ලෙස මහුට අභියෝග කිරීම.

3. පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් ඉදිරියේ යම් සාක්ෂිකරුවකු දීමට යන සාක්ෂි සම්බන්ධයෙන් මහුට අයුතු බලපෑමක් කිරීම, මහු භය ගැන්වීම, මහුට තර්ජනය කිරීම, මහු රැවටීම නැතහොත් යම් අන්දමකින් මහුට අයුතු ලෙස බලපෑම.

4. පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් රැවටීමේ අදහසින් පාර්ලිමේන්තුව වෙත හෝ යම් කාරක සභාවක් වෙත ව්‍යාජ, අසත්‍ය හේතු හෝ වරදවා පෙන්වූ ලේඛනයක් ඉදිරිපත් කිරීම.

5. පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවක යම් විවාදයක් හෝ කටයුතු පිළිබඳ යම් ව්‍යාජ හෝ අවවර්ණිත වාර්තාවක් හිතාමතා පළකිරීම නැතහොත් මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ දී හෝ කාරක සභාවේ දී පවත්වන ලද යම් කථාවක් හිතාමතා වැරදි ලෙස නිරූපණය කිරීම.

6. පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවක යම් විවාදයක් හෝ කටයුතු පිළිබඳ යම් වාර්තාවක් පළකිරීම පාර්ලිමේන්තුව විසින් තහනම් කර තිබිය දී එය හිතා මතා පළ කිරීම.

6අ. පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවෙන් (හැන්සාඩ්) යම් වචන හෝ ප්‍රකාශ ඉවත් කළ යුතු යයි කථානායකවරයා විසින් නියම කරනු ලැබීමෙන් පසු ඒ වචන හෝ ප්‍රකාශ හෝ ඇතුළත් පාර්ලිමේන්තුවේ යම් විවාදයක් හෝ එහි කටයුතු හෝ පිළිබඳ යම් වාර්තාවක් හිතැකමින් පළ කිරීම. (1980 අංක 17 § 2)

7. පාර්ලිමේන්තුවේ කටයුතු සහ එහි ස්වභාවය සම්බන්ධයෙන් යම් අපහාසාත්මක ප්‍රකාශයක් පළ කිරීම.

8. මන්ත්‍රීවරයකු වශයෙන් යම් මන්ත්‍රීවරයකුගේ ක්‍රියා කලාපය ගැන යම් අපහාසාත්මක ප්‍රකාශයක් පළකිරීම.

9. පාර්ලිමේන්තුවේ යම් මන්ත්‍රීවරයකුට හෝ නිලධරයකුට හෝ මන්ත්‍රීවරයකු නිලධරයකු වශයෙන් ඔහුගේ ක්‍රියා කලාපය කෙරෙහි බලපෑම් ඇති කිරීම පිණිස අල්ලසක් දීම හෝ ඔහු විසින් අල්ලසක් බාර ගැනීම නැතහොත් පාර්ලිමේන්තුව වෙත හෝ යම් කාරක සභාවක් වෙත ඉදිරිපත් කරන ලද නැතහොත් ඉදිරිපත් කිරීමට අදහස් කොට ඇති යම් පනත් කෙටුම්පතක්, යෝජනා සම්මතයක්, කරුණක්, රීතියක් හෝ දෙයක් ප්‍රවර්ධනය කිරීමක් හෝ ඊට විපක්ෂවීම සඳහා හෝ සම්බන්ධයෙන් යම් ගාස්තුවක්, වන්දියක්, ත්‍යාගයක්, හෝ තිළිණයක් පාර්ලිමේන්තුවෙන් යම් මන්ත්‍රීවරයකුට හෝ නිලධරයකුට දීම හෝ ඔහු විසින් එය භාරගැනීම.

10. රජයේ මුද්‍රණාලයාධිපති විසින් හෝ පාර්ලිමේන්තුවේ නොහොත් යම් කාරක සභාවකට බලය අනුව හෝ බලය යටතේ මුද්‍රණය කර ඇතැයි හැඟෙන, එහෙත් ඇත්ත වශයෙන් එසේ මුද්‍රණය කරනු නොලැබූ, යම් පනතක හෝ ආඥා පනතක නැතහොත් පාර්ලිමේන්තුවේ හෝ යම් කාරක සභාවක යම් වාර්තාවක, ලියවිල්ලක, කාර්ය සටහන්වල හෝ සම්මතවල හෝ කටයුතු වල පිටපත් මුද්‍රණය කිරීම නැතහොත් ඉහත කී යම් පිටපතක් සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීම.

11. ඉහත සඳහන් ඡේද කිසිවක නිශ්චය කොට දක්වනු ලබන යම් ක්‍රියාවකට හෝ නොකර හැරීමකට අනුබල දීම.

ආ කොටස

**පාර්ලිමේන්තුව විසින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් දඬුවම් කළහැකි වැරදි**

1. මේ පනත යටතේ පාර්ලිමේන්තුවේ යම් නියමයකට හෝ යෝජනා සම්මතයකට නැතහොත් මේ පනත යටතේ විධිමත් ලෙස කරන ලද සභාපතිවරයාගේ හෝ කථානායකවරයාගේ හෝ යම් මන්ත්‍රීවරයකුගේ නියමයකට අවනත වීම සිතාමතා පැහැර හැරීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

2. පාර්ලිමේන්තුව විසින් හෝ තත්කාර්ය සඳහා විධිමක් ලෙස බලය දෙනු ලැබූ යම් කාරක සභාවක් විසින් පැමිණීම සඳහා හෝ ලියවිලි, පොත්, වාර්තා, හෝ ලේඛන ඉදිරිපත් කිරීම සඳහා හෝ කරන ලද යම් නියමයකට පනතේ 13 වන වගන්තියෙන් හා 15 වන වගන්තියෙන් විධිවිධාන සැලැස්වෙන පරිදි පැමිණීමෙන් හෝ ඉදිරිපත් කිරීමෙන් නිදහස් කරනු ලැබුවහොත් මිස, සිතා මතා අවනත නොවීම.

3. 13 වන වගන්තියෙන් හා 15 වන වගන්තියෙන් විධිවිධාන සැලැස්වෙන පරිදි ප්‍රතික්ෂේප කිරීමට නිදහස ලැබ ඇත්නම් මිස පාර්ලිමේන්තුව ඉදිරියේ හෝ එවැනි යම් කාරක සභාවක් ඉදිරියේ ප්‍රශ්න කරනු ලැබීම හෝ පාර්ලිමේන්තුව හෝ කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන යම් නීත්‍යානුකූල වූත් අදාළ වූත් ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

4. පාර්ලිමේන්තුව තුළ දී හෝ කාරක සභාව තුළ දී හෝ පාර්ලිමේන්තු භූමිය තුළ දී යම් මන්ත්‍රීවරයකුට පහර දීම, නින්දා කිරීම, හෝ සිතාමතා බාධා පැමිණවීම.

5. පාර්ලිමේන්තුවේ සභාගර්භය තුළ දී හෝ කාරක සභාව තුළ දී හෝ පාර්ලිමේන්තු භූමිය තුළ දී පාර්ලිමේන්තුවේ නිලධරයකුට පහරදීම හෝ ප්‍රතිරෝධය පෑම නැතහොත් ඔහුගේ කටයුතුවලට සිතාමතා මැදිහත් වීම.

6. පාර්ලිමේන්තුව හෝ යම් කාරක සභාවක් රැස්ව සිටියදී පාර්ලිමේන්තුවේ හෝ කාරක සභාවේ කටයුතුවලට බාධාවන බව හෝ බාධාවනු ලැබීමට ඉඩ ඇති බව දැනුවත්ව නැතහොත් විශ්වාස කිරීමට සාධාරණ හේතු තිබිය දී පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළ හෝ කාරක සභාවක හෝ පාර්ලිමේන්තුව අවට යම් කලබලයක් ඇතිකිරීම හෝ එහිලා හවුල්වීම.

7. පාර්ලිමේන්තු භූමිය තුළ ගරු සරු නැතිව හැසිරීම.

8. පාර්ලිමේන්තුව ඉදිරියේ හෝ කාරක සභාවේ දී සාක්ෂිකරුවකු වශයෙන් ඇත්ත සඟවා කථාකිරීම හෝ වෙනත් විෂමාචාරයක්.

9. පාර්ලිමේන්තුවේ කාරක සභාවක කටයුතු කිසිවක් පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමට පෙර, ඒවා ප්‍රකාශනය කිරීම.

10. ඉහත සඳහන් ඡේද කිසිවක නියම්වය කොට දක්වනු ලබන ක්‍රියාවකට හෝ නොකර හැරීමකට අනුබල දීම.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.